


## කුඹි මිනිස්සු

සිරිපාලත් ඔහුගේ බිරිඳත් සිංගප්පුරුවට යාමට ගුවන් යානයට නැග තම අසුන්වල වාඩිවූහ. දැන් ගුවන් යානය ගමන් අරඹන බවටත් සියලුම මගීන් ආසන පටි පැළඳ ගන්නා ලෙසටත් ගුවන් යානය නිවේදනය කළේය. වහා ආසන පටි පැළඳගත් සිරිපාලගේ බිරිඳ ස්වල්ප වෙලාවකින් කවුළුවෙන් බිම බැලීය.

**බිරිඳ :** එයි ! බලන්නකෝ අපි දැන් ඉන්න උඩ, අර පල්ලෙහා ඉන්න මිනිස්සු දැන් පේන්නෙ කුඹියෝ වගේ අර.

**සිරිපාල :** කෑගහන්න එපා මෝඩියේ, ඒ කූඹි තමයි , අපි තාම ඉන්නෙ බිම.

## ප්‍රශ්ණ දෙක

**ශිෂයයා :** මහාචාර්යතුමාගෙන් කවිරුහරි ප්‍රශ්ණයක් ඇහුවම මහාචාර්යතුමා ප්‍රශ්ණ දෙකක් අහනවා කියන්නෙ ඇත්තද?

**මහාචාර්යතුමා :** කව්ද ? මමද ??

**ඔබගේ කෙටි රස කතාව අප වෙත එවන්න. මේ තීරයේ එය පළ කරන්නට අප සූදානම්.**

**විද්‍යුත් ලිපිනය:** chithran@sannasa.com.au

## ගාන්ධි තුමා සීනි කෑම නවත්වපු හැටි

දිනක් එක් කාන්තාවක් තම සය හැවිරිදි පුත්‍රයා මහත්මා ගාන්ධි වෙත කැඳවාගෙන ගියාය. "බලන්න ගාන්ධිතුමා මේ ළමයා හරියට සීනි කන්න ඇබ්බැහි වෙලා, මෙයාට අවවාදයක් දෙන්නකෝ, යැයි කීවාය. මොහොතක් කල්පනා කළ ගාන්ධි තුමෝ "මේ ළමයා හරියටම සතියකින් එක්කරගෙන එන්න මම අවවාද කරන්නම්, යැයි කිවේය.

හරියටම සතියකින් එම කාන්තාව තම දරුවා සමඟ යළිත් ගාන්ධිතුමා හමුවට ගියාය. දරුවා තමා අසලට ගත් ගාන්ධි තුමා "පුතා මීට පස්සෙ සීනි කන්න එපා'' යැයි අවවාද කළේය. මෙය කලින් ආ වෙලාවේ නොකලේ මන්දැ යි කාන්තාව ප්‍රශ්ණ කළාය. "කොහොමද මම එදා එහෙම අවවාද දෙන්නෙ, එදා වෙනකං මමත් සීනි කන්න ඇබ්බැහි වෙලානෙ හිටියෙ, ඉතින් මම සතියක් ඇතුලත සීනි කන එක නැවැත්තුව, එදා මමත් හොඳටම සීනි කන්න ඇබ්බැහි වෙලා ඉඳිද්දී මට මේ දරුවට අවවාද කරන්න බැහැනෙ, ගාන්ධිතුමා කිවේය.

**චෛතිය ගමගේ මාකොළ**




ජනාධිපති කාර්ය මණ්ඩලය 2500 ඉඳල 250 ට බැස්සුවලු .ඕවට තමයි සංදර්ශන කියන්නේ.
ජ.වී.පෙ

ඔය වගේ සන්දර්ශන නම් නරක නෑ ආයිබෝවන්.
අබරන්




